# ජෝතිට උපහාර වශයෙන් ගී සිහිවටනයක්




ශ්‍රීලංකාවේ අසහාය ජන ප්‍රිය ගායනා ශිල්පීව සිටි කලාශූරී එච්. ආර්. ජෝති පාල ගායකයාණන්ගේ අභාවයෙන් 22 වන වසර සැමරීම් වස් ඔහුගේ අමරණීය වූත්, සුවහසක් රසික ජනතාව ගේ සිත් බැඳගත්තාවූත්, ගීත 21 ක් සංයුක්ත තැටියකින් දැන් අප හමුවට එයි. මෙම ගීත ඉදිරි පත් කරන්නේ දක්ෂ ගායකයෙකු හා සංගීතඥ යෙකුද වන ඕස්ට්‍රේලියාවේ පර්ත් නගරයේ වෙසෙන නලින් ජයවර්ධන විසිනි. මෙම ගීත මෙම පරිගණක වෙබ් අඩවිය මගින් http://netcd.lankaderana.com. ඔබට නොමිළේ බා ගත හැකිය.

## In memory of Kalasuri H.R.Jothipala

In remembrance of the 22st death anniversary of the Late Sri Lankan Music Legend Kalaasuri H.R Jothipala, some of his immortal songs have been reproduced and have been made available on an audio CD format.

This production, consisting of 21 songs, features 20 greatest hits of H R Jothipala. The CD also includes a tribute song [lyrics by Dr. Vicumpriya Perera] to H R Jothipala. Music direction has been done by several leading artists and musicians [Sangeeth Wickaramasingha, Ananda Widiyasekara and the popular band Seeduwa Sakura] contributing generously towards the recreation of the musical tracks. All 21 songs are vocalised by Nalin Jayawardena. Duets were sung by Santhuri Wadiyasekara, a 16 year old from Gampaha.

Nalin was first Sri Lankan artist who made a Sinhala song CD available on the internet to be downloaded free of charges at
**http://netcd.lankaderana.com**
In that endeavour, he was supported by his brother Rohan Jayawardena and the premiere Sinhala music site
**www.sinhalajukebox.org**
on its production and delivery.

The 21 songs in this CD titled **"UPAHARA SIHIWATANA"** has been produced with variety of styles in mind: some are recreated to be felt as a live stage performance, some are almost closer to the originals with high quality recording using the same musical arrangements and instrumentations while the others are modified versions to suit the current musical trends and tastes.

The songs are now available to be downloaded through
**http://netcd.lakderena.com**
and at
**www.amazon.com**

and will also be distributed free of charge in Sri Lanka, a limited number of copies will be available for distribution among expatriates. Any fan who is interested in obtaining a free copy please email to
**naljaya@iinet.net.au**
with your name and postal address.

# පළාත් සභාවල හැටි මෙහෙමයි

දැනට ක්‍රියාත්මක වන පළාත් සභා අටේ මන්ත්‍රිවරුන් 417 කි. රජය මගින් පත් කළ ආණ්ඩුකාරවරුන් 9 දෙනෙකි. (උතුරු පළාත් සභාව ක්‍රියාත්මක නොවූවද එයට ආණ්ඩුකාරවරයෙකු පත්කර ඇත.) මහ ඇමතිවරු 8 දෙනෙකි. තවත් ඇමතිවරු 32 ක් සිටිති. මෙම ඇමතිවරුන්ගේ කාර්‍ය්‍ය මණ්ඩල, වැටුප්, යාන වාහන, දුරකථන, කාර්‍ය්‍යාල, නිල නිවාස ආදිය සඳහා වැයවන අති විශාල ධනස්කන්ධය කිසිදු පැහැදිලි අරමුණක් නැතිව බලය බෙදාහැරීමේ ප්‍රතිපල නොවේද? පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ගේ බිරියන්, සැමියන්, දූ පුතුන්, ලේකම්වරුන්, ආරක්ෂකයන්, රියැදුරන් ආදීන්ට රැකියා සැපයීම හා නැති සමාජ තත්වයක් ලබාදීම බලය බෙදාහැරීමේ තවත් ප්‍රතිඵලයක් ලෙස ද සමහරු දකිති. ජවිපෙ ට අනුව මේවා පළාත් සභා නොව වරිග සභාය.

තිස් වසරක් පුරා උතුරු නැගෙණහිර පැවති ත්‍රස්තවාදය යුද්ධයෙන් අවසන් කිරීමත් සමග අවතැන්වී සිටින ජනතා වට අද දවසේ අවශ්‍ය වී ඇත්තේ පළාත් සභා බලයක් හෝ පෙඩරල් ක්‍රමයක් හෝ නොව තමන්ටම කියා ස්ථාවර ආර්ථික තත්වයකි. හැමදාමත් ඔවුන්ට අනාථ කඳවුරුවලම දිවිගෙවන්නට බැරිය. ඔවුන්ට ඔවුන්ගේ ගම්වල ජීවන තත්වයක ලබාදිය යුතුව ඇත. දරුවන් ට පාසැල්, රෝගීන්ට රෝහල්, ක්‍රමවත් ප්‍රවාහනයක් කෙරෙහි වහා යොමුවිය යුතුව ඇත. එය ප්‍රායෝගික තත්වයකි. පළමුව එම ප්‍රායෝගික තත්වයන්ට මුහුණ දිය යුතුව ඇත.

♦ සමන්ත ඉලේපෙරුම
Sri Lanka

# සසර වසන තුරු

## ලන්ඩනයේ තැනූ සිංහළ චිත්‍රපටය





අධ්‍යක්ෂක ගාමිණී අබේසිංහ ප්‍රධාන නිළිය රුවිනි රණතුංග වේදිකාවේ ප්‍රේක්ෂක අබියස

ලන්ඩනයේ ජීවත්වන සිංහළ ජන කොටස අතර සිටින කලාකාමී පිරිසකගේ එකමිති යෙන් හා සහභාගිත්වයෙන් නිර්මාණය වුණු සිංහළ චිත්‍ර පටයකි සසර වසන තුරු. එය නොබෝදා බටහිර ලන්ඩනයේ පෙල්තම්හිදී ප්‍රදර්ශණය වීය. මෙම චිත්‍රපටයේ දෙබස්, තිර රචනය හා අධ්‍යක්ෂණය ප්‍රවීන වේදිකා හා සිනමා කලාකරු ගාමිණී අබේසිංහයන්ගේය. එංගලන් තයේ ජීවත්වන සිංහළ පවුලක් වටා ගෙතී ඇති වෘතාන්තය යොවුන් ආදරය එයට එල්ල වන දෙමාපිය අව හිර, ඒ නිසා අවුලට පත් වන යොවුන් ජීවිත ගැන කියන්නට කළ උත්සාහයක් ලෙස හැඳින්විය හැකිය.

රුවිනි රණතුංග, රුවින්ද ගාල්ලගේ, ශීලා මඩවල, කුමාර් වික්‍රමසිංහ, හේමා කෝරලගේ, අමිතා කුලරත්න, සන්ධ්‍යා ට්‍රෙනර්, ක්ලේරා ඕපාත, චන්න ලොකුලියන, උපාලි සුදසිංහ, විජය පොල්පිටිය, විතානගේ ධන රත්න, අචල වල්පොල, මද්දුම රත්නායක, ජනක අලහප්පෙරුම මෙහි චරිත රඟපාති.


කැමරාකරණය හා කාර්මික සැළසුම් තිස්ස මඩවල සහ අනුප මඩවලගෙනි. නිශ්පාදනය විජේවර් ධන රාජපක්ෂ සහ ගාමිණී අබේසිංහ දෙදෙනායි

සසර වසන තුරු චිත්‍රපටය තැනූ ගාමිණී අබේසිංහ ලන්ඩන් කලා ක්ෂෙත්‍රයට අමුත්තෙකු නොවේ. ඔහු ජනප්‍රිය කැළණි පාලම නාට්‍යය ලන්ඩන් වේදිකාවට ප්‍රති නිර්මාණය කළ අපූරුව අපි දුටුවෙමු. ඔහුගේ නිබඳ වැයම තම මව්බිමේ සංස්කෘතිය පාදක කොටගත් හොඳ නිර්මාණයක් බටහිරට ගෙන එන්නටය. එය අගේ කළ යුතුය



# කබරගොයා තලගොයා වීම

## 13 ට සුදු හුණු ගෑම



මම අංක විද්‍යාව ගැන එච්චර තැකීමක් කරන කෙනෙක් නෙවෙයි. ඒ නිසා වාසනාවන්ත නොම්මරයය අවාසනාවන්ත නොම්මරයය කියල අංක, නොම්මර, ඉලක්කම් ගැන විශේෂ යෙන් සිතා බැලීමක් මගේ නැහැ. අංක අතර 13 (දහතුන) අවාසනාවන්ත අංකය හැටියට ලොව බොහෝ දෙනා අතර අතීතයේ ඉඳලා පැවතෙන පිළිගැනීමක් තියෙන බව නම් මම දන්නවා. දහතුන නපුරුය කියන මෙම පිළිගැන්ම ආවේ ක්‍රිස්තියානි පල්ලියෙන් බවයි හුඟ දෙනෙක් කියන්නෙ. යේසුස් වහන්සෙගෙ අන්තිම භෝජන සංග්‍රහයට පිරිස 13 දෙනෙක් සහභාගි වුණා. දහතුන් වෙනියා තමයි ජුදාස් ඉස්කාරියොත්. ඒ ජුදාස් තමයි කෑමත් කාලා ඉවරවෙලා යේසුස් වහන්සෙ රිදී 30 කට පාවලා දුන්නෙ. අවසානයේ උන්වහන්සෙ කුරුසයේ තබා ඇණගැසුම් කෑවා. මෙයින් පස්සෙය කියනවා දහතුන මහා නරක අශුභ අවාසනාවන්ත අංකයක් වුණේ. ක්‍රිස්තියානි ලෝකය මුලින්ම පිළිගත්ත. ඒ මතය ලොව පුරාම දුවගියා.

දහතුන කියපු ගමන් සමහර අය බයවෙනවා. ලන්ඩනයේ හුඟක් පාරවල් වල 13 නොම්මරය තියන ගෙවල් නැහැ. දොළහ තියනවා. ඊළඟට තියෙන්නෙ 14 වෙනි ගේ. හුඟක් මහල් නිවාස වල 13 වන මහලක් නැහැ. සමහර ඉස්පිරිතාලවල 13 සටහන් කරපු ඇඳක් නැහැ, මොකද ලෙඩ්ඩු බයයි ඒ ඇඳට නගින්න. 13 සිකුරාදා දිනයක් නම් වැඩේ තවත් භයානකයි. සිකුරාදාට සමහරු කියන්නෙ සතියෙ නරකම දවස කියලා. ඒ මදිවට ඒක 13 වෙනි සිකුරාදා වුනාම බය කොච්චරද කියලා කියලා වැඩක් නැහැ. මේ විදියට දහතුන ගැන විසාල බයක් අප කා අතරත් තියනවා.

මේ දහතුනේ කතාව මට ඇදලා ගන්න හිතුනෙ 13 මුල්කරගෙන දැන් ශ්‍රීලංකාවෙ දේශපාලන මතභේදයක් හටගෙන තියන බව පෙනෙන නිසා. මේ මතභේදයට හේතුව තමයි අපේ රාජ්‍ය ව්‍යවස්ථාවෙ දහතුන්වන සංශෝධනය නැවත ගේන්න මහින්ද රාජපක්ෂ රජය සූදානම් වීම.

මේකෙ මුල මෙතනයි. 1978 දී සම්මත කරගත් ශ්‍රීලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දැනට 17 වතාවක් සංශෝධනය කරලා තියනවා. උතුරු නැගෙණහිර දෙමළ ත්‍රස්තවාදය ඇතිවුනාට පස්සෙ එවකට බලයෙ හිටිය ජේ. ආර්. රජය රටේ ප්‍රශ්නයට වටමේස සාකච්ඡාවක් කැඳෙව්වා. ඒකෙදි තීරණය කළා පළාත් මට්ටමින් බලය බෙදා දෙන්න පළාත් සභා ඇතිකරන්න. මේක නිකම්කරන්න බෑ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස්කරන්න ඕන. ඉතින් 13 වෙනි වතාවට කරපු සංශෝධනය උඩ තමයි පළාත් සභා පිහිටුවන්න තීරණය කළේ. ඒකට වැඩියත් හේතුවුණේ ඉන්දියාවෙ බලපෑම. ඒපාර දහතුන්වෙනි සංශෝධනය කරලා, පළාත් සභා පිහිටුවන්න තීරණය කරලා, ජේ. ආර්. / රජීව් ගාන්ධි ගිවිසුමක් ද 1987 දී අත්සන් කළා. ඒක අත්සන් කරලා එළියට ආව විතරයි රජීව් ගාන්ධිට ශ්‍රීලංකා නාවික හමුදාවෙ භටයෙක් රයිපල් බට් එකෙන් ගැහුවා. ඒකෙන්ම පේනවා දහතුන අවාසනාවන්ත බව. එතනින් නැවතුනේ නෑ. 13 ඉතාම අවාසනාවන්ත වුණා. ඊළඟ අවුරුද්දෙ රජීව් මැරුම්කෑවා.

13 වෙනි සංශෝධනය උඩ උතුර නැගෙණහිර එක්කාසු කළා. ඉන් පස්සෙ කොටි සංවිධානය කිව්වා අන්න හරි ඒ තමයි ද්‍රවිඩ නිජබිම කියලා. ඊට පස්සෙ කොටි සන්නද්ධ වෙලා බලවත් වුණු හැටි අපි දැක්කා. ජේවීපී පස්සෙ ඒ ඈඳීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දැම්මා. නඩුතීන්දුව අනුව උතුරු නැගෙණහිර ආයි වෙන් කළා.

දහතුන් වෙනි වගන්තිය යටතේ පිහිටවපු පළාත්පාලන ආයතනයි ඒවා හසුරුවන මහ ඇමතිවරුයි, ආණ්ඩුකාරවරුයි, ඒ සේවක පිරිසයි, ඒ සේරම පාලනය කරන්න යන වියදමයි බලනකොට රටේ තියන ධනය විනාසවීමක් විතරයි. ලංකාවෙ කිසිම පළාතක් දියුණු වෙලා නෑ.

ජනතාවගෙන් නැගී එන විරෝධතා සමනය කරන්න දැන් පත්තරවල සමහරු ලියනවා 13 ඉලක්කම ඔය කියන තරම් අවාසන්වන්ත නැත, ලෝකෙ සමහර හිටපු නායකයො දහතුන ඉතා වාසනාවන්ත නොම්මරයක් හැටියට ගණන් අරගෙන තියනවයි කියලා. ඒ ඇත්ත බොරු අපි දන්නෙ නෑ. මොකද ඒ නායකයො එකෙක්වත් දැන් නැති නිසා.

කබරගොයා මහ විසකුරු, ඒවගේම අප්‍රසන්න, පිළිකුල් සහගත සතෙක්. ඒත් ඌව කන්න හිතුනම සමහරු කියනවා " මූ කබරයෙක් නොවෙයි ඕයි මූ තලගොයෙක් " කියලා. 13 ගැනත් සමහරු ජනතාවට එහෙම චිත්‍රයක් පෙන්නන්නයි හදන්නෙ.

♦ වෙලේගෙදර රාළ London